# ඔබේම ලෝකය

**ඩිජිටල් තාක්ෂණය මඟින්, ආස්වාදජනක වැඩසටහන් පුළුල්ව හා ඔබ කැමති ආකාරයකින් නැරඹීමේ අවස්ථාවක් ලබාදීමට කටයුතු කර ඇත.**

ලොව විශාලතම ගුවන් විදුලි ආයතනය වන BBC ළමුන්ට හා වයස්ගත වූවන්ට විනෝදාත්මක වැඩසටහන් ලබාදීමට යයි. මේ බව ප්‍රකාශ කරන්නේ BBC රූප-වාහිනී සේවයේ අධ්‍යක්ෂිකා Jana Bennett ය. ඩිජිටල් තාක්ෂණයෙන් ලබාදෙන මෙම අලුත් විනෝද වැඩසටහන් පිළිබඳ BBC ය හොඳ විමසිල්ලකින් සිටී. මෙම අලුත් තාක්ෂණය හේතුවෙන් මිනිසුන් ගේ රූපවාහිනිය, රේඩියෝව සහ අනෙකුත් මාධ්‍ය භාවිතය වෙනස් වූයේ කෙසේදැයි BBC ය සොයා බලන්නට යොමු වී ඇත. ඒ සඳහා 2004 අප්‍රේල් මාසයේදී මාධ්‍ය සහ වෙබ් අඩවි වැඩි වශයෙන් භාවිත කරන්-නන්, සමඟ තොරතුරු හුවමාරු කර ගන්-නේය.

මෙයින් සොයාගත් කරුණු තුළින් පෙනී ගියේ මිනිසුන් විශාල වශයෙන් BBC යෙන් ඈත්ව ඇති බවයි. එයට හේතුව ලෙස Bannett දක්වන්නේ මිනිසුන්ට අවශ්‍ය දේ තමන්ගේ සේවයන් ලබා නොදීමයි. මේ දත්ත BBC ය තුළ විශාල දෙදරීමට ලක්-කරනු ලැබීය.

එසේම අනෙකුත් සමාගම් ඔවුන්ගේ නව ඩිජිටල් තාක්ෂණ කටයුතු ආරම්භ කරන බව දැනගත් BBC ය කැළඹීමකට පත් විය. මේ නිසා විවිධ අත්හදා බැලීමේ කටයු-තුවල BBC ය නිරත විය.

ඉහළ ගණයේ විකට දර්ශන ජංගම දුර-කතන මඟින් ලබා දීමට BBC ය කටයුතු කරන්නේ ඒ අනුවය. මේ පිළිබඳ විමසිල්-ලෙන් කටයුතු කළ යුතුබව BBC ය මඟින් නිෂ්පාදකයන්ට ද දන්වා ඇත. බෙනට් ගේ අදහස වන්නේ ආශ්වාදය නව දුරටත් ආවරණයක් නොවිය යුතු බවයි. ශ්‍රාවක-යන්ට ඔවුන් ප්‍රියකරන මාධ්‍යයක් තෝරා ගැනීමට අවස්ථාවක් ලබාදියයුතු සේම ඔවුන් සමඟ සමීප සම්බන්ධයක් ගොඩ-නගා ගත යුතු බව ද ඇය වැඩිදුරටත් පව-සයි.

21 වැනි සියවසේ මාධ්‍ය භාවිතය පිළිබඳ කරුණු 02 ක් BBC ය මඟින් අනාවරණය කරයි. දේශීය දේශපාලනය, ප්‍රවෘත්ති සේම විවිධ ආශ්වාදජනක වැඩසටහන්, තමන්ට





කැමති ආකාරයක් හැසිරීමට ඉඩ මෙම ඩිජිටල් තාක්ෂණය හේතුවෙන් අවස්ථාව ලැබී තිබීම ඉන් පළමුවැන්නයි. අවශ්‍ය දෑ අවශ්‍ය ඕනෑම වෙලාවක මේ තාක්ෂණය නිසා ලබාගත හැකි ය. වෙන් වෙන්ව විවිධ වෙබ් අඩවි තුළට සම්බන්ධ වීමට ද හැකි නිසා මාධ්‍ය තමන්ට අවශ්‍ය ආකාරයට සකස් කර ගැනීමට ද හැකියාව ඇත.

දෙවනුව, අන්තර්ජාලයට, ආශ්වාදජනක වැඩසටහන් නිෂ්පාදන කාලය, විකාශනය සේම භාවිතය පවා වෙනස් කළ හැකිය. චිත්‍රපටියක් විශාල තිරයක දිගහැරීම වෙනුවට, එය රූපවාහිනිය, වීඩියෝ සහ අන්තර්ජාලය හරහා කොටස් වශයෙන් ඉදිරිපත් කළහැකිය. එවිට එකවර එය මාධ්‍ය කීපයක දර්ශනය වේ.

එසේම ඔබ විසින් ලබා දෙනු ලබන දෑ ප්‍රතික්ෂේප කිරීමට ඩිජිටල් ලෝකයේ ජීවත්වන මිනිසුන්ට හැකියාව ඇත. නමුත් ඒ සියලු දෑ දිගු කාලයක් තබා ගනිමින් ශ්‍රවනයට, නැරඹීමට, කියැවීමට හැකියාව ඇත. මම ක්‍රමය LongTail ලෙස හඳුන්-වන අතර, ආස්වාදජනක වැඩසටහන්වල ආර්ථික තත්ත්වය පවා මේ තුළින් වෙනස් කළහැකිය. එනම් අතිසාර්ථක නිෂ්පාදන දීර්ඝ කාලීනව පැවතීම සඳහා නිර්මාණය කිරීමෙන් මෙසේ ආර්ථිකයට වෙනස්කම් කළ හැකිය.

නමුත් ඉන්, රූපවාහිනී වැඩසටහන්-වලින් ඉවත්වීමක් අදහස් කරන්නේ නැත. ආස්වාදජනක වැඩසටහන් තවදුරටත් පුළුල් කරමින් BBC ය මෑතක දී විකා-ශය කරන ලද 'Coast' වැඩසටහන මිලියන 5 ක් පමණ නරඹා ඇත. එය ජනගහනයෙන් 21% ක ප්‍රතිශතයක් වන අතරම එය පසුගිය අවුරුදු 05 තුළදී ලැබූ ප්‍රගතියට වඩා විශාල ප්‍රගතියකි.

මේ අදහස් නිසා 'අලුත් ආස්වාදජනක ලෝකය තුළ මිනිසා තනිවේවි' යන බිය BBC ය තුළ පවතී. එය සත්‍යයකි. එයට හේතුව වන්නේ ඩිජිටල් තාක්ෂණය සීමා රහිතව වැඩසටහන් සකස් කිරීමයි. මේ තාක්ෂණය නිසා පවුලේ සාමාජිකයන් පවා එකිනෙකාගෙන් දුරස් විය හැකිය. මව හා පියා වෙන් වෙන්ව රූපවාහිනිය නරඹන විට සොයුරිය On line ඔස්සේ ඇගේ මිතුරන් සමඟ සංවාදයේ යෙදෙනු ඇත. අන්තර්ජාලය ද විවිධ දෑ අලුතින් නිර්මාණය රමින් මෙම හුදකලාව තවත් වර්ධනය කරයි.



ජංගම දුරකථන මඟින් නාට්‍ය බැලීම සිදුකරයි. BBC ය ද තාක්ෂණික ලෙස කතාන්දර කීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. ඉන් කුඩාදරුවන් ඔවුන් ගේ වාර්තා සකස් කරගැනීමට පවා පෙළඹේ.

පසුගිය කාලයේ දී නිරිත දිග ආසියාවේ සිදු වූ ධූමකේතු හා සුනාමි අවස්ථාවල දී අන්තර් මාධ්‍ය මඟින් විවිධ රූප හා වාර්තා ඉදිරිපත් කරනු ලැබීය. මෙහිදී Rupert Murdoch පවසන්නේ, යම් සිදුවීමක් ඇසින් දුටුවෙකුගේ සංකල්පයක් තුළින් අපගේ දෛනික වාර්තාව සකස් කරන බවත්ය. එවිට පැන නගින ප්‍රශ්නය වන්නේ එහි ඇති ගුණාත්මක බවයි. එය පාලනය කරන්නේ කෙසේද? ඕනෑම අයෙකුට වාර්තාවක්, ප්‍රවෘත්තියක් මේ තාක්ෂණය ඔස්සේ නිර්මාණය කළ හැකි, නමුත් එහි අවසාන ප්‍රතිඵලය සුබදායක විය යුතුය.

වර්තමානයේ, බොහෝ සමාගම් ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු,Google සහ Yahoo ! වැනි වෙබ් අඩවි තුළින් සිදුකිරීමට අකමැත්තක් දක්වයි. ඊට හේතුව වන්නේ ඔවුන්, තමන්ගේ දත්තයන් සහ වීඩියෝ දර්ශන පාලනය කර තිබීමයි. නමුත්Com සඳහා වෙළෙඳපොලේ විශාල ඉල්ලුමක් පවතී. මේ තුළ භාවිත වන තාක්ෂණය උසස් වන අතරම පාරිභෝගික දත්ත ප්‍රමාණයද අතිවිශාලය.

21 වැනි සියවස වන විට මෙය තරමක් දුරට අසීරු වී ඇත. අන්තර්ජාලයට පිවිසීමට හෝ භාවිත කිරීමට හෝ අතරමැදියෙක් අවශ්‍යවන්නේ නැත. නමුත් අසීමිත තෝරාගැනීම් ඇති මෙම තාක්ෂණයේදී මෙම තෝරාගැනීමේ ක්‍රියාවලිය තුළ මිනිසුන් විඩාපත් වීමේ හා, මාධ්‍යවලින් ඉවත් වීමටද ඇති ඉඩකඩ ඉහළය. Nielsen ගේ දත්ත පෙන්වා දෙන පරිදි, රූපවාහිනී නාලිකා 100 ක් පමණ තිබුනත් දිනපතා භාවිත කරන්නේ D 12 ක් හෝ ඊට සමාන ගණනක් බවයි.

වර්තමානය වන විට ගද්‍යකොටසක් පමණක් නොව සංගීතය, වීඩියෝ, ප්‍රියතම ගීතය, නාට්‍ය, පැරණි චිත්‍රපට ආදී සියල්ල පිටපත් කිරීමේ පහසු ක්‍රම සකසා ඇත.

තාක්ෂණික ලෝකයේ ජීවත්වන ස්වයංක්‍රීය කතුවරුන් පිළිබඳ කණගාටුව පළ කරන අයද වෙයි.

ඉංජිනේරුවන් ඇතුළු තාක්ෂණික නිලධාරීන් උත්සාහ දරන්නේ නිර්මාණශීලී වැඩසටහන් තෝරා මාධ්‍යයට එය යොමු කිරීමට විනා, කථාවකට, නාට්‍යයකට, පර්යේෂණ ග්‍රන්ථයකට සිදුවන දෙය පිළිබඳ ඔවුන්ට වැදගත් නොවේ. සමහර විට ඒ අයිතමයන් නැති වී යාමට පුලුවන. නැතිනම් එම වැඩසටහන් සරල අයුරින් අන්තර්ජාලයට පිවිසීම පුලුවන.

මේ සියලු දෙයට ලැබිය යුතු පිළිතුර කුමක් වුවත්, වර්තමානයේ මේ විස්මිත තාක්ෂණය මාධ්‍යයේ නිෂ්පාදන වැඩසටහන්, විකාශනය, සේම නැරඹීමේ ක්‍රමයන් ද වෙනසකට ලක්කිරීමේ කාර්යය ආරම්භ කර ඇත. නිෂ්පාදකවරුන් විවිධ කථා නිෂ්පාදනය කරමින් අත්හදා බලන්නේ, නරඹන්නන් කතාවේ අවසානය ඔවුන් විසින්ම නිපදවා ගන්නා ආකාරයයි.

මේ තාක්ෂණය හමුවේ BBC ය දිගින් දිගටම තම පසුබෑම ප්‍රදර්ශනය කරනු ලැබීය. මේ නිසාම Jana Bennett ඩිජිටල් තාක්ෂණය අනාගත විනෝද වැඩසටහන්වලට එල්ල කළ හැකි අභියෝග සඳහා සිදුකරන කාළ නිර්ණය කිරීමේ අභ්‍යාසවලට සහභාගී වන ලෙස ප්‍රධාන නිලධාරීන්ගෙන් ඉල්ලීමක් ද කරනු ලැබුවාය. ඇය තව දුරටත් පවසන්නේ, කිසිම අයකුට මීට අවුරුදු 10 කට පෙර සිදුවූ ජංගම විප්ලවය පිළිබඳ අනාවැකි කීමට නොහැකි වූ අතරම, තව අවුරුදු කීපයකින් සියලු දෙනාටම වැටහුණු අයුරු සොයා බැලීම රසවත් කරුණක් වනු ඇති බවයි. කුමන මාධ්‍යයකින්, කුමන විනෝදාත්මක වැඩසටහන් ඉදිරිපත් කළත්, නරඹන්නන් හෙට දවසේදී විනෝදාත්මක වැඩසටහන් ඔවුන් විසින්ම ඉදිරිපත් කරනු ලබන කාර්‍යයක් බවට පත් වේවි. ❑

**එස්.ඒ. නයනා සුරවීර**